*Vidyodaya J. of Humanities and Social Sciences, (2011) Vol 3 PP 177-197*

# සාරධර්ම වර්ධනය සඳහා නාට්‍ය හා රංග කලාව

**විජය ශ්‍රී. විතාරණ**
**භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය**

**සංක්ෂේපය**

මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ පුද්ගල සාරධර්ම වර්ධනයෙහිලා නාට්‍ය හා රංග කලා විෂයයේ ඇති වැදගත්කම විමර්ශනය කිරීම ය. වසර දෙදහස් පන්සියයකට අධික ප්‍රෞඪ ඉතිහාසයක උරුමය ලද ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ අවිච්ඡින්න ව ගලාගෙන ආ ඇදහිලි විශ්වාස හා සාරධර්ම පද්ධතිය තුළින් පුද්ගල විමුක්තිය සාක්ෂාත් කරගැනීම පමණක් නො ව ශිෂ්ට සම්පන්න සමාජයක් ද ගොඩනැගුණු බව නොරහසකි. කරුණු එසේ වුවත්, වත්මන් ශ්‍රී ලාංකික ජන සමාජය මුහුණ පා ඇති ප්‍රධානතම ගැටලුව නම් මනුෂ්‍යයන් තුළ එකී සාරධර්ම පරිහානි මුඛයට පත් වීමේ ප්‍රවණතාවයි. සමාජය තුළට අඛණ්ඩ ව ගලාඑන විවිධ සංස්කෘතික ප්‍රවාහයන්හි බලපෑම නිසාත්; තරගකාරි ආර්ථික, සමාජයීය හා අධ්‍යාපනික රටාව නිසාත් පුද්ගලයින් තුළ සමාජ සාරධර්ම පිළිබඳ ව රික්තයක් පවතී. මෙය මුලු මහත් ලෝක ප්‍රජාව ම වර්තමානයේ මුහුණ පා ඇති සංකීර්ණතම ගැටලුවක් බවට පත් වී ඇත.

මෙම අධ්‍යයනයේ දී, සාරධර්ම යනු කවරේ ද යන්න පිළිබඳව විග්‍රහ කෙරන අතර සාරධර්මවල ඓතිහාසික දෘෂ්ටිකෝණයත් ආගමික සහ මනෝවිද්‍යාත්මක පදනමත් විමර්ශනය කෙරේ. එසේ ම සාරධර්ම වර්ධනය සඳහා නාට්‍ය හා රංග කලා විෂයයෙන් ලැබෙන පිටිවහලත් එහි ඇති අධ්‍යාපනික හා මනෝවිද්‍යාත්මක වැදගත්කමත් විමසා බැලේ.

**මූල පද :** සාරධර්ම, නාට්‍ය, රංග කලාව, විෂයමාලාව, අධ්‍යාපනය.

## හැඳින්වීම

මිනිස් සන්තානගත මානසික අසහනය හේතුවෙන් ලොව පුරා ගැටලු රාශියක් උද්ගත ව පවතී. එමගින් බාහිර පරිසරය මිනිසාටත්, මිනිසා බාහිර පරිසරයටත් අභියෝගයක් වී ඇත. වත්මනෙහි මිනිසා මුහුණ පාන භූගෝලීය සීමාවෙන් ඔබ්බට ගිය ප්‍රශ්න රැසක් විද්වතුන් ගේ අවධානයට ලක් වී ඇත. යුදකරණය, පරිසර පරිහානිය, දරිද්‍රතාව, ජනගහන ප්‍රසාරණය, මනුෂ්‍ය අයිතිවාසිකම් උල්ලංඝනය, කාන්තා හිංසනය, මත්ද්‍රව්‍ය භාවිතය, සාරධර්ම බිඳ වැටීම ආදි ප්‍රශ්න ඒ අතර ප්‍රධාන වේ.

සදාචාරාත්මක වශයෙන්; සමාජ හරයන් නොතැකීම, ආගමික වශයෙන් ඈත් වීම, වැඩිහිටියන්ට නොසැලකීම, බොරුකීම, වංචා, දූෂණ ආදිය ද, අධ්‍යාපනික වශයෙන්; තරගකාරී අධ්‍යාපන රටාව, විරැකියාව, තරුණ අසහනය ද, සංස්කෘතිමය වශයෙන්; විදේශීය සංස්කෘතිකාංග වැළඳගැනීම, සිරිත් විරිත් ඓතිහාසික වටිනාකම් විනාශ කිරීම, අසභ්‍ය චිත්‍රපට, වීඩියෝ පට, පුවත්පත් ආදිය ද, ආර්ථිකමය වශයෙන්; විවෘත ආර්ථික රටාව, තාක්ෂණය අහිතකර ලෙස යොදා ගැනීම, දෙමාපිය රැකියා නියුක්තිය, විදේශ රැකියා නියුක්තිය ද, සමාජමය වශයෙන් පවුල් අසමගිය, න්‍යෂ්ටික පවුල් රටාව ,අපරාධ දූෂණ ආදිය ද, දේශපාලනික වශයෙන්; විවිධ දේශපාලන චින්තාවන් අතර පවතින ගැටුම්, තරුණ අදහස් මත ගැටුම්, ප්‍රචණ්ඩ ක්‍රියා ආදිය ද සමාජයෙන් සාරධර්ම ඈත් වීමට බලපා ඇති ප්‍රධාන සාධක ලෙස දැක්විය හැකි ය.

සංවර්ධනය නැමැති මිරිඟුව පසුපස හඹා-ගිය ලෝකයා අද පිවිස සිටින්නේ අතිශය තීරණාත්මක වූත් බිය ගෙනදෙන්නා වූත් මාවතක් වෙතට ය. සංවර්ධනයේ නාමයෙන් මිනිසා විසින් නිපදවන ලද භාණ්ඩ හා උපකරණ සමස්ත මානවයා ගේ දිවි තොර කිරීමට සමත් වී ඇත. ලොව මිනිස් ජනගහනයෙන් තුනෙන් එකක් පමණ නිරාහාර ව පෙළෙද්දී ඔවුන් සුවපත් කළ හැකි අතිමහත් ධනස්කන්ධයෙන් වැඩි කොටසක් මිනිසාගේ ම විනාශය පිණිස වූ අවි නිපදවීම හා යුද කටයුතු වෙනුවෙන් වැය කෙරේ. මිනිසා ලබාගෙන ඇති සිය අනගි ජීවිතය වඩාත් අර්ථවත් වන්නේ මිනිසා විසින් මිනිසාට පමණක් නො ව මිනිසා විසින් තිරිසන් සතුන් කෙරෙහි ද අනුකම්පා සහගත අයුරින් ක්‍රියා කිරීමෙනි.

ඉහත සඳහන් කළ කරුණු අතුරින් ප්‍රධාන ගැටලුවක් වන්නේ සාරධර්ම බිඳ-වැටීම යි. සාරධර්ම බිඳ-වැටීම අවම කොට සාරධර්මවලින් පිරි විනයවත් සමාජයක් ස්ථාපිත කිරීමත් සමග සෙසු ප්‍රශ්නවලින් සෑහෙන ප්‍රමාණයක් අවම කරගැනීමට අවකාශ උදා වෙයි. මෙහි ලා අධ්‍යාපනයට පැවරෙන වගකීම අසීමිත ය. ලෝක යුද්ධ, තරුණ අසහනය, රැකියා විරහිතබව, දූෂණය, අපරාධ, සමාජ ගැටුම්, අන්තර්ජාතික පීඩනය ආදි සියලු ම අනර්ථකාරී ප්‍රතිඵල සඳහා වර්තමාන අධ්‍යාපනය ක්‍රමය ද එක් හේතුවක් වී ඇත. එම නිසා අධ්‍යාපනයට කළ හැකි බලපෑම අතිමහත් ය.

සෑම ශිෂ්ටසම්පන්න සමාජයක ම එහි අඛණ්ඩ, සමෝධානික පැවැත්ම හා වර්ධනය සඳහා ස්ථිරසාර වටිනාකම් හා අරමුණු පද්ධතියක් බාල පරපුර වෙත පැවරීම, ඔවුන් තුළ චරිතායනය වීම අවශ්‍ය වෙයි. එම වටිනාකම්, සමාජ හරයන් හා ධනාත්මක ආකල්ප ආදිය ඊළඟ පරම්පරාවට සම්ප්‍රේෂණය වන්නේ අධ්‍යාපනයෙනි. ඒ මගින් සමාජයක ගුණ සම්ප්‍රදාය රැක ගැනෙන්නේ ය. එසේ නොවන්නේ නම් සමාජ ව්‍යුහය දෙදරා යනු ඇත. අවිනිශ්චිත අසහනකාරී මෙන් ම සාමුහික වශයෙන් බලාපොරොත්තු විරහිත තත්ත්වයක් (collective hoplessness) ඉන් මතු වීම නියත ය. ලෝකයේ විවිධ සමාජ පිළිබඳ මෙවැනි සාරධර්ම අර්බුදයක් හටගෙන ඇති බවත්, හරි වැරදි ය යි නම් කළ හැකි මිනිස් හැසිරීම් රටාවන් පිළිබඳ පැහැදිලි දෘෂ්ටියක් එම සමාජවලට නැති බවත් කාල් මැන්හයිම් (Karl Mannheim) සහ එරික් ෆ්‍රොම් (Erich Fromm) ආදීහු මීට දශක කිහිපයකට පෙර පැවසූහ. 1990 දී නිකුත් කරනු ලැබූ තරුණ අසහන කොමිෂන් සභා වාර්තාව මගින් ද අප සමාජයේ සාරධර්ම අර්බුදයක් හටගෙන ඇති බව පෙන්වා-දෙනු ලැබ ඇත.

වර්තමානයේ ප්‍රධාන ගැටලුවක් ව පවතින සාරධර්ම බිඳ වැටීම පිළිබඳ ව අද සමස්ත ලෝකයේ ම අවධානය යොමු ව ඇත. එබැවින් පසුගිය දශක කිහිපය තුළ අධ්‍යාපන, ආර්ථික හා සමාජීය ක්ෂේත්‍ර අළලා පැවැත් වූ ජාත්‍යන්තර හා ජාතික සමුළු රැසක් සාරධර්ම පිළිබඳ විශේෂ අවධානය යොමු කර තිබෙනු දක්නට ලැබේ. 1973 දී ජපානයේ ටෝකියෝ නුවර පැවති ලෝක අධ්‍යාපන සම්මේලනයේ වාර්තාවට අනුව වර්තමාන අධ්‍යාපන කෙෂ්ත්‍රය සතු කාර්ය භාරය අතර සදාචාර අධ්‍යාපනයට ප්‍රධාන තැනක් හිමි වන බව පෙන්වා දෙන ලදී.

(අතුකෝරල, 1999.105 පිටුව) 1972 දිවි පැවැත්ම සඳහා ඉගැනීම නැමැති යුනෙස්කෝ ජාත්‍යන්තර අධ්‍යාපන කොමිසමේ වාර්තාවට අනුව පුද්ගලයා කායික, බුද්ධිමය, චිත්තවේගීය හා ආචාර විද්‍යාත්මක වශයෙන් පූර්ණ මිනිසකු බවට සංකලනය කිරීම අධ්‍යාපනය පිළිබඳ මූලික පරමාර්ථයෙහි පුළුල් අර්ථ නිරූපණයක් බව සඳහන් වේ. (දිවිපැවැත්ම සඳහා ඉගෙනීම,1998.155 පිටුව)

1980 දී පැරිස් නුවර පවත්වන ලද නිරායුධකරණය සඳහා වූ ලෝක සංගමය විසින් යුදබිය, අවිබිය හා සතුරු බිය නම් වූ තුන් බිය දුරු කිරීම උදෙසා මිනිස් සිත නිරායුධ කළ යුතු බව සඳහන් කරන ලදී. (කාරියවසම්,1999.38 පිටුව) 1990 දී යුනෙස්කෝව විසින් පවත්වන ලද (Learning to care Education for the twenty first century) සැලකිලිමත් වීමට ඉගෙනීම 21වන සියවසට අධ්‍යාපනය නම් සාකච්ඡාවේ දී ජාත්‍යන්තර හා ජාතික මට්ටමෙන් සැම අයකු විසින් ම ක්‍රියාත්මක කළ යුතු සාරධර්ම හඳුන්වා දී තිබේ. 1995 පළ කරන ලද සංස්කෘතිය හා සංවර්ධනය පිළිබඳ ලෝක කොමිසමේ වාර්තාව මගින් ද ලෝක ගම්මානයක් සඳහා විශ්ව සම්මානනීය ආචාර ධර්ම අවශ්‍ය බව පෙන්වා දී ඇත. (Learning to be Unesco Press,1972).

21 වන සියවස සඳහා වූ ජාත්‍යන්තර අධ්‍යාපන කොමිසමට අනුව ජාත්‍යන්තර ප්‍රජාව හා එක්සත් ජාතීන්ගේ ආයතන විසින් පිළිගනු ලැබූ මානව අයිතිවාසිකම්, සහජීවනය, සාමය, ප්‍රජාතන්ත්‍රවාදය, පරිසරය සුරැකීම, දිළිඳු බව මැඩලීම වැනි වටිනාකම් ප්‍රගුණ කළ යුතු බව අවධාරණය කර තිබේ.

මෙලෙස පසුගිය දශක කිහිපය මුළුල්ලේ ලෝක මට්ටමෙන් පැවති සම්මේලන කිහිපයකින් ම මානව සදාචාරය පිළිබඳවත් කරුණු අනාවරණය කර ඇත. ජාතික මට්ටමෙන් සලකා බැලුවද මෙරට විටින් විට ඇති වූ කල කෝලාහල පිළිබඳ ව කරුණු විමසා බැලීමට පත් කළ කොමිසම් මගින් සාරධර්ම අධ්‍යාපනයේ වැදගත්කම පෙන්වා දී ඇත.

මෙබඳු තත්ත්වයක් මත රටේ සැම ස්තරයක ම වෙසෙන ජනතාවට සාරධර්ම පිළිබඳ අවබෝධයක් ලබා දීම කාලීන අවශ්‍යතාවක් ව පවතී. ඒ අතර සැම ආයතනයක ම ප්‍රධානීන් ආදර්ශවත් ව ක්‍රියා කිරීම ද අත්‍යවශ්‍ය සාධකයකි.

වටිනාකමකින් යුතු සාරධර්ම දැන සිටීම පමණක් ප්‍රමාණවත් නැත. තමා උගත් සාරධර්ම ජීවිතයට සම්බන්ධ කර ගැනීම ද අවශ්‍ය කෙරේ. එසේ ම සංවර්ධිත රටවල විද්‍යාත්මක හා තාක්ෂණික දියුණුව සලසන ක්‍රම මගින් තමන්ගේ සංස්කෘතිය පමණක් නො ව අන් රටවල ද ලෝක ප්‍රජාවගේ ද සංස්කෘතිය විනාශ කරනු ලැබේ. න්‍යෂ්ටික අවි සහ  අන්තර්ජාල හරහා  ඇතැම් චිත්‍රපට් මගින් කෙරෙන ප්‍රචාරණ ආදිය නිසා එම ප්‍රවණතාව වඩාත් බරපතල ලෙස දැනෙමින් පවතී. ආර්ථික ධනෝපායන් වෙත අවතීර්ණ වෙමින් එකිනෙකා පරදවා ක්‍රියා කිරීමෙන් සාරධර්ම වඩාත් වේගයෙන් දුරස් වෙමින් පවතී. සංවර්ධනය වෙමින් පවතින රටවල ද මෙම තත්ත්වය ම දැකිය හැකි ය. ඊට අතිරේක ලෙස ආභ්‍යන්තරික ව මතු වී ඇති ගැටලු ද මේ තත්ත්වය වඩාත් තීව්‍ර කරයි. විශේෂයෙන් ක්‍රමයෙන් දියුණු වන බහුවිධ සමාජවල විවිධ ජන කොටස් කෙරේ මෙන් ම සමාජ කුලකවල ද අසමගිය ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතී. දෙමාපිය, වැඩිහිටි, ගැටවර, ළමා ආදි කාණ්ඩ ලෙස වෙන් වෙන් වශයෙන් මෙන් ම සාමූහික ලෙස ගත් විට ද සදාචාරාත්මක පිළිගැනීමක් දක්නට ලැබේ. මෙම විවිධ කුල සහ සමාජ පන්ති අතර තීරණ ගන්නා විට දී ගැටුම් ඇති වීම මගින් මෙම සාරධර්ම පිරිහීම පිළිබිඹු කෙරේ. සාරධර්ම අධ්‍යාපනය සියලු රටවලට අත්‍යවශ්‍ය වන්නේ එහෙයිනි. ශ්‍රී ලංකාව ගත්විට ද මෙහි වඩාත් විනාශකාරී තත්ත්වයක් කරා එළඹෙමින් පවතින බව කිව යුතු ව ඇත. සාම්ප්‍රදායික උපායයන් හා සාරධර්ම රැගත් සංස්කෘතිය; මූල්‍යවාදී සමාජ ක්‍රමයක් ඔස්සේ ගලා යන්නට ඉඩ සැලැස්වීමත් සමග තදබල පරිහානි තත්ත්වයකට ලක් වෙමින් පවතී. පුද්ගල සංවර්ධනයට සාරධර්ම වර්ධනය අත්‍යවශ්‍ය ය. මෙය ඇත්ත වශයෙන් ම අධ්‍යාපනයේ කාර්යයකි. අධ්‍යාපන ආයතනවල වඩාත් අවධානය යොමු වී ඇත්තේ දැනුමත් ඇතැම් විෂයයන් ආශ්‍රිත ව කුශලතාත් මුල් කොට ගැනීම පමණි. ආකල්ප යන්න හුදු මානසික විපර්යාසයක් කෙරෙහි යොමු කරවීම හෙයින් මෙය ආවේදනාත්මක ව වර්ධනය කර ගැනීමට අධ්‍යාපන ආයතනවල කාර්යභාරය ප්‍රමාණවත් නැත.

යම් අයකු ගේ පෞද්ගලික හා සමාජ ජීවිත සාර්ථක කර ගැනීමට පුද්ගලයාට ඒ පිළිබඳ ව අවශ්‍ය ප්‍රතිවේදය සැපයෙනුයේ සාරධර්ම අධ්‍යාපනයෙනි. එහෙයින් යහපත් සමාජගත වීමක් සඳහා සාරධර්ම පුහුණු කිරීම  සුවිශේෂී ව ඉටු විය යුතු ය.

යථෝක්ත කරුණු විමර්ශනය කිරීමෙන් එළඹිය හැකි නිගමනයක් නම්, පුද්ගල සාරධර්ම පිරිහීමට බලපෑ හේතු කාරක බොහෝවක් අප විසින් ම ළඟා කරගත් ගැටලු බව යි. උදාහරණ: විරැකියාව, තරුණ අසහනය, විවෘත ආර්ථික රටාව

මෙම ගැටලු හේතු කොට ගෙන පුද්ගල සාරධර්ම ශීඝ්‍රයෙන් පිරිහී-යාම දෘශ්‍යමාන තත්ත්වයකි. ඕනෑ ම රටක අධ්‍යාපන අරමුණු සකස් කිරීමේ දී එම රටේ ආර්ථික, දේශපාලනික, සංස්කෘතික හා සමාජීය යන සාධකයන් සැලකිල්ලට ගත යුතු ය. නොඑසේ නම් සිදු වන්නේ රටට අනවශ්‍ය මෙන් ම නොගැළපෙන උගතුන් බිහි වීම පමණි. අධ්‍යාපනයෙන් රටට අවශ්‍ය ශ්‍රමිකයන් බිහි කළ යුතු ය. එමෙන් ම සැම පුද්ගලයකුට ම වෘත්තීය මාර්ගෝපදේශයක් ලබාදිය යුතු ය.

## සාරධර්ම හැඳින්වීම

සාරධර්ම යනු පුද්ගලයකු ගේත් සමාජයේත් යහපැවැත්මට හා සංවර්ධනයට හේතු වන වටිනාකම් සමූහයක් හෙවත් හර පද්ධතියකි. මෙම හර පද්ධතීන් පුද්ගල හා සමාජ සංවර්ධනයට හිතකර වන පරිදි සකස් වෙමින් හා හැඩ ගැසෙමින් පෝෂණය වෙයි.

සාරධර්ම යනු කුමක් දැයි "පීස් වර්ල්ඩ්" නැමති ග්‍රන්ථයේ මෙසේ සඳහන් වේ.

"මනුෂ්‍යයකු ගේ පැවැත්මේ හරය ලෙස හැඟෙන්නා වූ ද, පුද්ගලයකු ගේ මූලික හා අද්විතීය අයිතියක් වූ ද පුද්ගලයකු ගේ චර්යාවට බලපෑමක් ඇති කරන්නා වූ ද පුද්ගලයකුගේ හැඟීම් පාලනය කර අදහස් සමතුලිතතාවට පත් කරන තාත්ත්විකයන් සාරධර්ම ලෙස හැඳින්වේ. සාරධර්ම ස්ථිතික නොවන අතර පුද්ගලයා ගේ වැඩීමත් සමඟ වෙනස් වෙමින් සංවර්ධනය වේ. අනන්‍යතාවන් හා අන්‍යෝන්‍ය උපජීවනය තුළින් පුද්ගලයකු වැඩෙන විට ඔහු තමන් ගේ සාරධර්ම නිරන්තරයෙන් තෝරා - ගනී. "

තවත් විග්‍රහයකට අනුව "සාරධර්ම යනු සමාජයේ ජීවත් වන පුද්ගලයා තමා හමුවේ ඇති විවිධ විකල්ප අතුරින් වඩාත් උතුම් හා වැදගත් යැ යි සලකා ක්‍රියාවට නැංවීමට වරණය කොට ගන්නා චර්යා පද්ධතියකි. "

"සාරධර්ම යනු පුද්ගලයකු තුළ විනිශ්චයකින් පසු තීරණයකට එළඹිය යුතු ධර්මතාවකි. එමෙන් ම එය ඉගෙනීම තුළින් අධ්‍යාසයෙන් ම වරණය කොටගත් ක්‍රියා පද්ධතියකි. "

"සාරධර්ම යනු උසස් චින්තන විලාසයන් සමූහයකි. කෙනෙක් තුළ උසස් චින්තනයක් පහළ වන්නේ පුද්ගලයකු විචාරවත් වීමෙනි. විචාරවත් පුද්ගලයා තුළ හොඳ නරක තෝරා බේරා ගැනීමේ හැකියාව හා නිවැරදි විනිශ්චයකට එළඹීමේ ශක්තිය විද්‍යමාන වේ. "

යථෝක්ත නිර්වචනයන්ට අනුව සාරධර්ම යනු කිසියම් පුද්ගලයෙකු විසින් ඉගෙනීමෙන් වරණය කොට ගත යුතු විනිශ්චයකින් පසු තීරණ ගත යුතු තමා හා සමාජයේ ශුභ සිද්ධියට හේතු වන කිසියම් වටිනාකම් සමූහයක් හෙවත් හර පද්ධතියකි. එමෙන් ම එය සැම පුද්ගලයකු තුළ ම චරිතායනය විය යුතු ය. සාමූහික හා සමස්ත සමාජ ක්‍රියාවලිය තුළ ද විද්‍යා මාන විය යුතු උසස් ධර්මතා සමූහයක් ලෙස ද සැලකිය හැකි ය.

## සාරධර්මවල ඓතිහාසික පදනම

සාරධර්ම ඉතිහාසය ප්‍රාග්-ඓතිහාසික යුගය දක්වා දිවෙන්නකි. මානව ශිෂ්ටාචාරයේ සමාරම්භක යුගයේ මිනිසුන් තුළ ඇදහිලි විශ්වාස සිරිත් විරිත් ඇවතුම්-පැවතුම් හා සාරධර්ම පද්ධතියක් තිබෙන්නට ඇතැ යි සිතිය හැකි ය. අග්ගඤ්ඤ සූත්‍රයේ ලෝකෝපත්ති කතාව තුළින් ලෝකයේ සාරධර්ම හා චර්යා ධර්මවල මූල බීජ දැකිය හැකි බව පෙනේ. නාට්‍ය කලාවේ ආරම්භය ද ඇදහිලි විශ්වාස හා බැඳි පූජා කර්ම හා අනුකරණ ආශ්‍රයෙන් සිදු වූ බව විචාරක මතය යි. මිනිසා ක්‍රම ක්‍රමයෙන් දියුණු ශිෂ්ටාචාරයක් කරා ළඟා වත් ම උසස් සාරධර්ම පද්ධතියක් ගොඩ නැගෙන්නට ඇත. ලෝකය පෙර අපර දෙදිග සැම ශිෂ්ටාචාරයක් ම අධ්‍යයනය කරන විට පැහැදිලි වන විශේෂ කරුණක් නම් එම ශිෂ්ටාචාරයන්හි සාරධර්ම ගොඩ නැගීමේ දී ආගමික විශ්වාස පදනම් කර ගෙන ගුණාත්මක වෙනසක් ඇති වූ බව යි. ඉන්දියාව, ජපානය, ග්‍රීසිය වැනි ඉපැරණි ආගමික ශිෂ්ටාචාර මෙයට උදාහරණ ලෙස ගත හැකි ය. ආර්යාගමනයත් සමඟ ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාස බිහි විය. එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් සතු කලා ශිල්ප, භාෂා, ආගමික විශ්වාස හා ඇදහිලි ආදිය විවිධ සංස්කෘතික දායාදයන් මෙරටට ලැබිණි. එම ආර්ය ශිෂ්ටාචාරය පදනම් කරගෙන ලාංකිකයන් සිය සාරධර්ම සකස්

කරගත් බව පෙනේ .මහාවංසයේ පණ්ඩුකාභය සමය පිළිබඳ විස්තරයේත් එවකට පැවති විවිධ ඇදහිලි විශ්වාස හා සාරධර්ම පිළිබඳ ව තොරතුරු සොයාගත හැකි ය.

## සාරධර්මවල ආගමික පදනම

බුදු දහමින් ඔපවත් ව දියුණු ශිෂ්ටාචාරයක ප්‍රෞඪ ඉතිහාසයක් ඇති බෞද්ධයින් හට උසස් සාරධර්ම රැසක් උරුම කර දී ඇත. ඕනෑ ම දේශයක ජීවත් වන මනුෂ්‍යයින් හට උරුම වූ සාරධර්ම පද්ධතිය ගොඩනැගීම සඳහා ඔවුන් ගේ ආගම මුල් වී ඇත. සාරධර්ම ගොඩනැගෙන්නේ ප්‍රධාන වශයෙන් ම ආගමික හික්මීමක් පදනම් කරගෙන ය. සෑම ආගමක් ම පුද්ගලයා ගේ දියුණුව හා යහපත් පැවැත්ම සඳහා අදාළ වන සාරධර්ම සමූහයක් හඳුන්වා දී ඇත. මෙසේ මිනිසා ගේ යහපත් පැවැත්ම සඳහා විවිධ ආගම් දර්ශන හා චින්තාවන් රැසකින් උසස් සාරධර්ම හා චර්යා ධර්ම රැසක් හඳුන්වා දී ඇත. ඒ අතර බෞද්ධ, හින්දු, කිතුණු, ඉස්ලාම් සහ  විවිධ දර්ශන වාද ප්‍රධාන කොට ගත හැකි ය.

විශේෂයෙන් ලාංකේය සාරධර්ම පද්ධතිය ජීවය ලබා ඇත්තේ බෞද්ධ සංස්කෘතියේ සාරධර්ම ආභාසය ලැබීමෙනි. මහින්දාගමනයෙන් ඔපවත් වූ බෞද්ධ සංස්කෘතික සාරධර්ම මුලුමහත් ලාංකේය සමාජය පුරා ම ප්‍රචලිත විය. බෞද්ධාගම සාරධර්මවල තෝතැන්නක් ලෙස සැලකිය හැකි ය. බුදු දහමේ චතුරාර්ය සත්‍ය, ආර්ය අෂ්ටාංගික මාර්ගය, පටිච්ච සමුප්පාදය, ත්‍රි ලක්ෂණය, ත්‍රි ශික්ෂා ආදිය උසස් බෞද්ධ සාරධර්ම ලෙස සැලකේ. තව ද බුදු දහමේ දේශනා කොට ඇති මංගල සූත්‍රය, පරාභව සූත්‍රය, සිඟාලෝවාද සූත්‍රය, වසල සූත්‍රය, ධම්මික සූත්‍රය, කරණිය මෙත්ත සූත්‍රය, රතන සූත්‍රය ආදී සූත්‍ර රැසකින් පුද්ගල විමුක්තිය සහ යහපත් දිවි පැවැත්ම සඳහා උසස් සාරධර්ම රාශියක් ඉදිරිපත් කොට ඇති බව පෙනේ.

බෞද්ධාගමික සමාජයක් ගොඩ නැගීම සඳහා ලෝභය, ද්වේෂය, මෝහය, නොතිබිය යුතු ය. ඒ වෙනුවට අලෝභය, අද්වේෂය, ඥානය, ශීලය, ප්‍රඥාව, වීර්යය, සත්‍යය, අධිෂ්ඨානය, මෛත්‍රිය, උපේක්ෂාව වැනි ගුණධර්ම වර්ධනය කළ යුතු බව බෞද්ධ දේශනාවල දක්වා ඇත.

## සාරධර්මවල මනෝ විද්‍යාත්මක පදනම

සාරධර්ම ඉගෙනීම, වරණය කොට ගැනීම, විනිශ්චය කිරීම සාරධර්ම පිළිබඳ ඇගයුම ආදිය කිසියම් ආකාරයක මනෝවිද්‍යාත්මක පදනමක් මත සිදු වන බව කිව හැකි ය. කිසියම් පුද්ගලයකුට ඕනෑ ම විෂයක් ඉගෙනීමට, වරණය කොට ගැනීමට, ග්‍රහණය කරගැනීමට හා එම කරුණු චරිතායනය කරගැනීමට නම් එම විෂය පිළිබඳ කිසියම් පෙළඹවීමක් තිබිය යුතු ය.. පෙළඹවීම යනු පුද්ගලයා තුළ ක්‍රියාත්මක වන මනඃකායික ක්‍රියාවකි. එසේ ම මනෝවිද්‍යාත්මක අවශ්‍යතාවකි.

පෙළඹවීම හෙවත් අභිප්‍රේරණය පිළිබඳ ව අධ්‍යාපන මනෝ විද්‍යාඥයන් විසින් පෙලඹවීම් න්‍යායයන් කීපයක් ඉදිරිපත් කරනු ලැබ ඇත. මෙම න්‍යායයන් අතර ඒබ්‍රහම් මාස්ලෝ විසින් ඉදිරිපත් කරනු ලැබූ අවශ්‍යතා න්‍යාය වැදගත් කොට සැලකිය හැකි ය. එම න්‍යායට අනුව පුද්ගලයකුට ඕනෑ ම ක්‍රියාවක් සඳහා පෙළඹවීමක් ඇති වන්නේ ඔහුට මූලික අවශ්‍යතා කීපයක් ඉටු වීමෙන් පසු ය. මාස්ලෝ විසින් ඒ සඳහා මූලික අවශ්‍යතා 5ක් හඳුන්වා දී ඇත.

- ශාරීරික අවශ්‍යතාව
- ආරක්ෂාව පිළිබඳ අවශ්‍යතාව
- ආදරය පිළිබඳ අවශ්‍යතාව
- ගරුත්වය (පිළිගැනීම ) පිළිබඳ  අවශ්‍යතාව
- ආත්ම සම්මානන අවශ්‍යතාව

පෙළඹවීම ඇති වීම සඳහා මෙම අවශ්‍යතාවන් පුද්ගලයකු තුළ එකිනෙක පිළිවෙළින් ඉටු විය යුතු බව ඔහු කියයි. ඒ සඳහා ඔහු විසින් අවශ්‍යතා අනුක්‍රමතා නියමාවලියක් ඉදිරිපත් කොට ඇත.

යථෝක්ත න්‍යාය අපට වැදගත් වන්නේ පුද්ගලයකු තුළ සාරධර්ම ඉගෙනුම පිළිබඳ හා විනිශ්චය පිළිබඳ කිසියම් පෙළඹවීමක් ඇති වන්නේ ඔහුගේ මූලික අවශ්‍යතා ඉටු වීමෙන් අනතුරුව වන බව යි. එම මූලික අවශ්‍යතා නම් ආහාර, ජලය, ආදරය, සුරැකියාව, ආත්ම සම්මානනය යනාදිය යි. මෙය සාරධර්ම කෙරෙහි බලපාන එක් මනෝ විද්‍යාත්මක සාධකයකි. පෙළඹවීම පිළිබඳ සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් ඉදිරිපත් කර ඇති මනෝ විශ්ලේෂණ න්‍යාය ද මේ සඳහා බලපාන බව පෙනේ.

ෆ්‍රොයිඩ් විසින් පෙළඹවීම සම්බන්ධව සංස්කාරකයන් තුනක ක්‍රියාකාරිත්වයන් ඉදිරිපත් කරයි. එනම්; ඉඩ්, ඊගෝ සහ සුපර් ඊගෝ යන සංස්කාරය. මෙම න්‍යායට අනුව සාරධර්ම විෂයේ වැදගත්කම දක්වන්නේ සුපර් ඊගෝ තත්ත්වය යි කිසියම් පුද්ගලයකු තුළ මෙම උපරි අසම්භාවය ක්‍රියාත්මක වන ආකාරය අනුව ඔහු තුළ සාරධර්ම පිළිබඳ ඉගැනීමට ඇති පෙළඹවීම ඇති වෙයි.

සාරධර්ම පිළිබඳ විග්‍රහ කිරීමේ දී සදාචාර විනිශ්චය පිළිබඳ මනෝවිද්‍යාත්මක විග්‍රහයන් කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ව ඇත. සදාචාර විනිශ්චය පිළිබඳ අදහස් ඉදිරිපත් කළ මනෝවිද්‍යාඥයන් අතර කෝල්බර්ග්, සිග්මන්ඩ් ෆ්‍රොයිඩ්, ලෝරන්ස්, හැවින්ස් හර්ට්ස් ආදීන් ප්‍රමුඛත්වයෙහිලා සැලකිය හැකි ය.

සදාචාර වර්ධනය පිළිබඳ පියාජේ ගේ මතයට පදනම වන්නේ බුද්ධි වර්ධනය පිළිබඳ ඔහු විසින් ඉදිරිපත් කළ න්‍යාය යි. සදාචාර සංවර්ධනය ප්‍රධාන අවධි 2ක් ඔස්සේ සිදුවන බව පියාජේ පවසයි..

**සදාචාර සත්වාදී අවධිය** (උපතේ සිට අවුරුදු 8 දක්වා)

මෙම අවධියේ දී අනුකරණය සිදුවේ. නීති රීති ගැන කිසිම අවබෝධයක් නැත. වැඩිහිටියන් පනවන නීති පූජනීය ලෙස සලකයි.

**සදාචාර සාපේක්ෂතා අවධිය** (අවුරුදු 12 සහ ඊට වැඩි)

වැඩිහිටි ආඥාවට වඩා එහි සදාචාරාත්මක වටිනාකම අනුව ම තෝරාගැනීමට ළමයා මේ අවධියේ දී උගනී.

ළමයා ගේ සදාචාර සංකල්ප මෙසේ වෙනස් නොවනසුලු යථාර්ථ නිරූපණ ලෙස සලකන මුල් අවස්ථාවේ සිට සදාචාර පරස්පරතාව හෙවත් වඩාත් පරිණත අවස්ථාව දක්වා විකාශනය වන බව පියාජේ ගේ න්‍යාය යි. පියාජේ ගේ පර්යේෂණය අනුව නිගමනය කළ හැකි වැදගත් ම සිද්ධාන්තය නම් සදාචාරයත් මානසික වර්ධනයත් සමාන ව සිදු වන බව යි. සදාචාරය ප්‍රජානන චිත්ත වර්ධනයත් සමග ඉතා සමීපතා ඇත. භාෂා වර්ධනය, සංකල්ප වර්ධනය හා සිතීමේ වර්ධනය අනුව ළමයා ගේ සදාචාර වර්ධනය සිදුවේ. සදාචාර අධ්‍යාපනය

පිළිබඳ මනෝවිද්‍යාත්මක අදහස් ශිෂ්‍යයන් තුළ සාරධර්ම වර්ධනයෙහි ලා ඉතා වැදගත් කොට සැලකිය හැකි ය.

## සාරධර්ම අධ්‍යාපනය

අධ්‍යාපනය යන වචනය තුළ ඉගැනීම හැදියාව යන අදහස් දෙක ම එකට ගැබ් ව පවතී. සෑම දාර්ශනිකයකු ම ඉගෙනුම සමඟ එක්ව යන පදයක් ලෙස සදාචාරය සලකා ඇත. අතීත අධ්‍යාපන ක්‍රමයේ දැනුම සහ සිතීම එක් ව ගමන් කර ඇති බව පෙනේ.

අධ්‍යාපනය යනු හුදෙක් දැනුම ලබා දීම පමණක් නො ව එහි ප්‍රමුඛ අංගයක් ලෙස සාරධර්ම පෝෂණය දැක්විය හැකි ය. අපේ පැරණි අධ්‍යාපන ක්‍රමයෙහි සදාචාරයෙන් තොර අධ්‍යාපනයක් නො වීය. මේ පිළිබඳ ව කරුණු දක්වන වල්පොල රාහුල හිමියෝ මෙසේ කියති. අධ්‍යාපනයේ පරමාර්ථය වූයේ සදාචාරය හා අධ්‍යාත්ම වර්ධනය යි. මේ අර්ථයෙන් තොර හුදු ශාස්ත්‍රෝද්ග්‍රහණය වැදගැම්මකට නැති දෙයක් හැටියට සලකනු ලැබී ය. (ශ්‍රී රාහුල හිමි,1993.303 පිටුව) අධ්‍යාපනය මගින් බිහි කළ යුත්තේ පූර්ණ සදාචාර වර්ධනයකින් යුතු පුද්ගලයකු ය යන අදහස ප්ලේටෝ ගේ වැදගත් අදහසකි. ගාන්ධිතුමාට අනුව අධ්‍යාපනය යනු ළමයා ගේ මනසේ හා අධ්‍යාත්මයේ ඇති විශිෂ්ටතම ලක්ෂණ සාමූහික ව පුබුදුවාලීම ය. එනම්; චරිතය ගොඩනැංවීම යන අදහස යි. ස්වයංවිනය තුළින් චරිත වර්ධනය ඇති කළ යුතු ය යන්න ඔහුගේ අධ්‍යාපන යෝජනාවකි. බ්‍රහ්මචාරී ව කාලය ගත කිරීම, සදාචාර ගතිගුණ වර්ධනය පරාර්ථකාමී බව, අවිහිංසාව අධ්‍යාපනයේ පරමාර්ථ විය යුතු බවත් ඒ තුළින් පුද්ගල අධ්‍යාත්ම දියුණුව මෙන් ම සමාජ දියුණුව ද සැලසෙන බවත් ගාන්ධි ගේ අදහස විය.

සාරධර්ම අධ්‍යාපනය අවශ්‍ය යැ යි කවුරුත් පිළිගනිති. එහෙත් මෙම සාරධර්ම පුහුණුව යම් අවස්ථාවල අහම්බෙන් මිස වැඩි අවධානයක් ඇති ව සිදු වන ක්‍රියාදාමයක් නොවන බව පෙනේ. රැල්ප් පෙරී ගේ මෙම ප්‍රකාශයේ අරුත නම්; තුලනාත්මක ව සාරධර්ම අධ්‍යාපනය නොසලකා ඇති බව යි. සද්ගුණය ඉගැන්විය හැකි ද යන ප්ලේටෝ ගේ ප්‍රශ්නය ඇසුරින් විග්‍රහ කරන ගිල්බර්ට් රයිඩ් සදාචාර සාරධර්ම; ඉතිහාසය, භෞතික විද්‍යාව, ගණිතය හා සමාන නොවන බවත් ප්‍රකාශ කරයි.

ශ්‍රී ලාංකික සමාජයේ සාරධර්ම අධ්‍යාපනය ආරම්භ වන්නේ බෞද්ධාගමික පදනම මත සකස් වූ පිරිවෙන් අධ්‍යාපන ක්‍රමයෙනි. ඉපැරණි බෞද්ධ අධ්‍යාපනය හා සාරධර්ම අධ්‍යාපනය එකිනෙකට වෙන් කළ නොහැකි සේ අන්‍යොන්‍ය සබැඳියාවෙන් පෝෂණය වූවක් ලෙස සැලකිය හැකි ය. උසස් සදාචාරාත්මක ජීවිතයකට මඟ පෑදීමක් අවසානයේ පුද්ගල විමුක්තිය හා නිවන ලබා-දීමත් බෞද්ධ අධ්‍යාපනික පරමාර්ථ ය. එම පරමාර්ථ කරා ළඟා වීමට නම් උසස් විනය හා සමාජ ධර්ම ආරක්ෂා කළ යුතු වෙයි. පුද්ගල විමුක්තිය ලබාගැනීම සඳහා පිළිපැදිය යුතු සාරධර්ම හා ආචාර ධර්ම පද්ධතියක් බෞද්ධ ඉගැන්වීම්වලට ඇතුළත් කොට ඇත.

අප රටේ සාරධර්ම අධ්‍යාපනය ආගම තුළින් පවරා-දීමට වැඩි නැඹුරුවක් දක්වයි. එහෙයින් බහුවිධ සමාජයක් නිසා වන ආගමික තත්ත්වයන් මත සමස්ත ශ්‍රී ලංකාව තුළ සම්ප්‍රේෂණය වනුයේ විවිධාකාර වූ සාරධර්ම සමූහයකි. මෙයින් මූලධර්ම ලෙස ගත හැකි සමාජ හරයන් තිබුණ ද එම ගුණාංගයන් වර්ධනය කිරීමට තරම් කාලයක් අධ්‍යයන කාලසටහන්වල ලැබී තිබේ ද යන්න විමසිය යුතු කරුණකි. එසේ ම ද්විතීයික හා තෘතීයික අධ්‍යාපනයේ විෂයානුබද්ධ ක්‍රියාරකම්වල මෙසේ සාරධර්ම අධ්‍යාපනය සඳහා විශේෂ අවධානයක් යොමු කරන බවක් නො පෙනේ. බොහෝ විට සාරධර්ම සම්ප්‍රේෂණය කරන්නේ අහම්බෙන් මිස හිතා මතා නො වේ.

ශ්‍රී ලංකික සමාජය තුළ ශීඝ්‍රයෙන් සිදු වන සාරධර්ම පරිහානිය අප හමුවේ ඇති ප්‍රබල අභියෝගයකි. මෙම අභියෝගය ජය ගැනීම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයට භාරදූර කාර්යයක් පැවරේ. නූතන අධ්‍යාපනඥයන් හා සමාජ විද්‍යාඥයන් අවධාරණය කරනුයේ සමාජයට යහපත් බාල පරපුරක් බිහි කිරීම අධ්‍යාපන කාර්යය භාරයේ කොටසක් බව යි. සාරධර්ම යන වචනයෙන් ගම්‍යමාන වන ආකාරයට සරු දහම සාරධර්ම ලෙස සැලකිය හැකි අතර ඒවායේ ආරම්භය සෙවීම අපහසු බවත් මානව ශිෂ්ටාචාරය ආරම්භයේ සිට ම සාරධර්ම පැවතුණ බවත් නිගමනය කළ හැකි ය. ප්‍රාථමික යුගයේ ජීවත් වූ අය තුළ පවා ඔවුන්ට ආවේණික වූ සාරධර්ම තිබුණත් ඒවා නූතන මිනිසා අපේක්ෂා කරන ආකාරයේ සාරධර්ම නොවුණත්, දිගු කලක් තිස්සේ මිනිසා ලබාගත් සාරධර්ම යුගයෙන් යුගයට වර්ධනය වෙමින් පරම්පරාවට පැවරෙමින් අද පවතින තත්ත්වයට වර්ධනය වී තිබෙන බව පෙනේ.

විධිමත් පාසලේ ආගම විෂය මගින් පමණක් සාරධර්ම පිළිබඳ අවබෝධයක් සිසුන්ට ලැබේ සාරධර්ම; විද්‍යාව, ගණිතය, භාෂාව ආදි විෂයයන් මෙන් පන්ති කාමරය තුළ ඉගැන්විය නොහැකි ය. එසේ ම සාරධර්ම පිළිබඳ ව සිසුන් දැනුවත් කිරීම පමණක් ප්‍රමාණවත් නො වේ සාරධර්ම ශිෂ්‍යයාට අභ්‍යන්තරීකරණය වීමට නම් ඒවා ක්‍රියාත්මක කළ යුතු පරිසරයක් තිබීම අත්‍යවශ්‍ය සාධකයකි. එම නිසා මෙරට සමාජයෙන් ගිලිහී-යමින් පවතින සාරධර්ම ප්‍රතිෂ්ඨාපනය කිරීමෙහිලා නාට්‍යය හා රංග කලා විෂයයට සුවිශේෂී කාර්යය භාරයක් ඉටු කළ හැකි ය.

නාට්‍යකරණය යනු එක ම අරමුණක් ඔස්සේ කරන්නා වූ සාමූහික ප්‍රයත්නයකි. ඉගැන්වීමේ කටයුතුවල දී නාට්‍යකරණය මාධ්‍යයක් වශයෙන් හෝ ක්‍රමයක් ලෙස උපයෝගී කරගැනීමේදී එහි අන්තර්ගත ව ඇති විවිධ සාමූහික කටයුතු තුළින් අධ්‍යාපනලාභීන්ට විවිධත්වයකින් හා නව්‍යතාවකින් යුතු අපූරු අධ්‍යාපන අත්දැකීම් මාලාවක් ලබා දිය හැකි ය. විටින් විට පංතිවල දී හෝ කණ්ඩායම් මගින් හෝ එය කළ හැකි ය. වෙන් කරනු ලැබූ විෂය මාලාවක් ඉගෙන ගන්නා ළමයින්ට භාෂාව, ගණිතය, ඉතිහාසය, ආගම, ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, භෞතික විද්‍යාව ආදී නානාවිධ විෂයයන් අතර ඇති සම්බන්ධය දැක්වීමට ඇති ප්‍රබලතම මාධ්‍යය නාට්‍යකරණය යි. සාරධර්ම අධ්‍යාපනයට ද එය සාධාරණ ය. නාට්‍යකරණයෙන් ලද හැකි ආදර්ශ අප්‍රමාණ ය. ලෝකය දෙස බැලීමටත්, ආගම් කුල ආදී භේදයෙන් තොර ව අසල්වැසියන් දෙස මානසික ව සුහද ලීලාවෙන් බැලීමටත් ජීවිතයේ මුහුණ පෑමට සිදු වන ගැටලු බුද්ධිමත් ව විසඳා-ගැනීමටත් ශිෂ්‍යයන් ගේ සිත් තුළ ඇති වන ආක්‍රමණශීලී හා නිෂ්ක්‍රමණශීලී ගති-පැවතුම් සමනය කිරීමටත් යහපත් ආකල්ප හා පරමාදර්ශ දරුවන්ට ලබා-දීමටත් නාට්‍යකරණය ඉතා පොහොසත් මාධ්‍යයක් වනු ඇත. මේ අනුව පුද්ගල සාරධර්ම වර්ධනයෙහිලා අතිශය වැදගත් ස්ථානයක් නාට්‍ය හා රංග කලා විෂයයට හිමි වන බව කිව හැකි ය.

## සාරධර්ම වර්ධනයෙහි ලා නාට්‍ය විෂයේ ඇති අධ්‍යාපනික හා මනෝ විද්‍යාත්මක වැදගත්කම.


වත්මන් ජන සමාජයේ පුද්ගලයන් තුළින් දිනෙන් දින ම ශීඝ්‍රයෙන් ඉවත් ව යන සාරධර්ම නැවත ඔවුන් තුළ වගා කිරීම සඳහා අඩිතාලම දැමිය යුත්තේ අධ්‍යාපනයෙනි. සාරධර්ම අධ්‍යාපනය විෂයක් ලෙස පාසල් විෂය මාලාවට

ඇතුළත් කිරීමේ වැදගත්කම හා එහි අවශ්‍යතාව පිළිබඳ අධ්‍යාපනඥයන් විසින් යෝජනා කර තිබුණ ද මෙතෙක් ශ්‍රී ලංකාවේ පාසල් තුළ සාරධර්ම විෂයක් ලෙස ඇතුළත් කොට නැත. ද්විතීයීක සහ තෘතීයික  අධ්‍යාපන ක්ෂේත්‍රයන් තුළ ද එසේ ම ය. මේ අනුව අධ්‍යාපන ආයතන තුළ සාරධර්ම ඉගැන්වීම කළ යුත්තේ සෙසු විෂයන් හා බද්ධ කොට ගැනීමෙනි. පාසල් විෂය මාලාවේ ඇති සියලු විෂයන් අතුරින් සාරධර්ම අධ්‍යාපනයෙහිලා සැලකිය යුතු මෙහෙවරක් සෞන්දර්ය විෂයයන් මගින් ඉටු කළ හැකි බව පෙනේ. ද්විතීයික සහ තෘතීයික අධ්‍යාපන කෙෂත්‍රයන් තුළ ද එසේ කළ හැකි ය. සෞන්දර්ය විෂයයන් අතුරින් ද නාට්‍ය විෂය උක්ත කරුණ සම්බන්ධයෙන් සුවිශේෂී වැදගත්කමක් දක්වන බව පෙනේ.

සාරධර්ම ඉගැනීම, වරණය කිරීම, විනිශ්චය කිරීම, පිළිපැදීම යන සියලු ක්‍රියාවන්ට මුල් වන්නේ පුද්ගලයා ගේ හදවත යි. එනම්; හදවතෙහි වේදනීය පක්ෂය යි. මෙම ලක්ෂණය නාට්‍ය විෂය තුළ විශේෂයෙන් දැකිය හැකි ය. මෙය නාට්‍ය විෂය තුළ අන්තර්ගත ආධ්‍යාපනික හා මනෝ විද්‍යාත්මක ගුණයකි. බී. එස්. බ්ලූම් නැමැති අධ්‍යපනඥයා ඉදිරිපත් කර ඇති අධ්‍යාපන අරමුණු වර්ගීකරණය අනුව නාට්‍ය විෂයෙහි ඇති අධ්‍යාපනික වැදගත්කම තවදුරටත් විමසා බැලිය හැකි ය. එම වර්ගීකරණයට අනුව අධ්‍යාපනය ක්ෂේත්‍ර තුනකට බෙදා දක්වයි. එනම්;

1. ප්‍රජානන ක්ෂේත්‍රය - (දැනුම)
2. ආවේදනික ක්ෂේත්‍රය - (ආකල්ප)
3. මනෝචාලක ක්ෂේත්‍රය - (කුශලතා) යනුවෙනි.

අධ්‍යාපනය අනිවාර්යයෙන් ම සමතුලිත විය යුතු බව බ්ලූම් ගේ අදහස යි. මනා පෞරුෂයකින් යුතු යහපත් පුරවැසියකු බිහි කරලීම අධ්‍යාපනයේ මුඛ්‍ය පරමාර්ථය යි. එම අරමුණ සාක්ෂාත් කර ගැනීමට නම් පුද්ගලයා තුළ කායික, මානසික, චිත්තවේගීය, බුද්ධිමය හා සදාචාරාත්මක යන සැම අංශයක ම තුලනාත්මක වර්ධනයක් ඇති විය යුතු ය. සාරධර්ම, සමාජ හරයන්, හොඳ නරක, යුතු අයුතුකම්වලින් අවිධිමත් පූර්ණ සදාචාරවත් පුද්ගලයෙක් බිහි කළ හැක්කේ ආවේදනික ක්ෂේත්‍රයේ අරමුණු ඉටු කරගැනීම තුළිනි. සෞන්දර්ය අධ්‍යාපනයේ පරමාර්ථය ද එය යි. බ්ලූම් විසින් ඉදිරිපත් කළ ආවේදනික ක්ෂේත්‍රය ඩී. ආර්. ක්රැත්වෝල් විසින් තව දුරටත් පුළුල් ලෙස විග්‍රහ කරන ලදී. එනම්;



මේ අනුව කිසියම් පුද්ගලයකු තුළ සාරධර්ම චරිතායනය වීම සඳහා ආවේදනික ක්‍ෂෙත්‍රය මැනවින් ක්‍රියාත්මක විය යුතු බැව් පැහැදිළි ය. මෙහි දී නාට්‍ය විෂයෙන් ලැබෙන පිටිවහල ඉතා වැදගත් වෙයි.

නාට්‍ය කලාවේ සජීවී බවත්, ක්‍රියාකාරී බවත්, ජීවිතය හා සම්බන්ධ විවිධ සිද්ධින් හා අවස්ථා මගින් ඍජු අත්දැකීම් ලබා-ගැනීමේ ශක්‍යතාවත්, නාට්‍ය විෂයයේ ඇති වැදගත්කමකි. සාරධර්ම ඉගැන්වීමේ දී ආවේදන කෙෂ්ත්‍රය මැනවින් ක්‍රියාත්මක විය යුතු ය. වින්දන ක්‍ෂේත්‍රයේ අරමුණුවලින් අපේක්ෂා කරන්නේ පුද්ගලයා තුළ යහපත් පැවතුම්, සිරිත් විරිත් හැඟීම් චිත්තවේගීය සමබරතාව ගොඩනැඟීම ය. මෙම කරුණු සමස්තයක් වශයෙන් ගත් කල සිදු වන්නේ පුද්ගල සදාචාරාත්මක අවධි බව යි.

මෙහි දී පාසල් විෂය මාලාවේ එක් එක් විෂයයන් මගින් මෙම අරමුණු සාධනය වන ආකාරය මෙසේ දැක්විය හැකි ය.

**අංක -1 වගුව -විවිධ විෂයයන් තුළින් චර්යාමය අරමුණු සාධනය වන ආකාරය**

| විෂය | ප්‍රජානන ප්‍රතිශතය | ආවේදනික ප්‍රතිශතය | මනෝචාලක ප්‍රතිශතය |
|---|---|---|---|
| ඉතිහාසය | 50% | 25% | 25% |
| සෞන්දර්ය (නාට්‍ය) | 25% | 50% | 25% |
| කෘෂිකර්මය | 25% | 25% | 50% |


පූර්වෝක්ත කරුණු අනුව පැහැදිලි වන්නේ සෞන්දර්ය විෂයයන් සෙසු විෂයවලට වඩා ආවේදනික කෙෂත්‍රයට නැඹුරු වී ඇති බව යි. එනම්; වින්දනාත්මක පක්ෂය වැඩි වශයෙන් ක්‍රියාත්මක වන බව යි. ඉන් සිදු වන්නේ හදවත පෝෂණය වීම යි. මෙම විෂයයන් අතුරින් නාට්‍ය විෂයයට අද්විතීය ස්ථානයක් හිමි වේ. නාට්‍ය විෂයේ ඇති සුවිශේෂී ලක්ෂණ ඇසුරින් මෙම කියමන සනාථ කළ හැකි ය.

නාට්‍ය කලාවේ සම්භවයේ සිට පෙනෙන සුවිශේෂී ලක්ෂණයක් නම්, මෙම මාධ්‍ය ඒකීය උපාය මාධ්‍යයක් නොවන බව යි. මෙය සාමූහික කලා මාධ්‍යයකි. මෙම අදහස සනාථ කරන නූතන නාට්‍ය විචාරකයකු වන අයිෆර් එවන්ස් පෙන්වා-දෙන්නේ නාට්‍ය සම්මිශ්‍රිත කලාවක් වශයෙන් සාරධර්ම වර්ධනයෙහිලා ඇති සුවිශේෂ ශක්‍යතාව නම් එහි අත්‍යන්තයෙන් ම ඇති

සාමූහිකතාව බව යි. නාට්‍ය සාමූහික ප්‍රයත්නයකි. ඒ තුළින් සාමූහික වර්ධනයක් ඇතිවේ. මෙවැනි ක්‍රියාකාරකම්වල දී සුහදතාව, එකමුතුකම, වගකීම් දැරීම, යුතුකම් ඉටුකිරීම යනාදී සාරධර්ම රාශියක් එම සිසුන් තුළ නිරායාසයෙන් ම රෝපණය වෙයි. මෙය සාරධර්ම වර්ධනයෙහි ලා නාට්‍ය විෂයේ ඇති අධ්‍යාපන වැදගත්කමකි. මෙම ගුණාංග ප්‍රයෝජනයට ගනිමින් ශිෂ්‍යයා සමාජානුයෝගී කිරීම නාට්‍ය අධ්‍යාපනයේ පරමාර්ථයකි.

එඩ්ගාර් ඩේල් ගේ අත්දැකීම් කේතුව ඇසුරින් ද නාට්‍යකාර අත්දැකීම්වල ඇති ශක්‍යතාව පිළිබඳව අවබෝධ කොට ගත හැකිය.

**රූප සටහන-1 එඩ්ගාර් ඩේල්ගේ අත්දැකීම් කේතුව**




ඉහත අත්දැකීම් මාලාව බෲනර්ට අනුව ද එකඟත්වයක් ඇති බව කියවේ. මෙම අත්දැකීම් කේතුවේ නාට්‍ය අත්දැකීම්වලට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. ඩේල්ට අනුව එය ප්‍රථම ගණයේ ක්‍රියාකාරී අත්දැකීමක් ලෙස පිළිගැනේ.

## සාරධර්ම වර්ධනයෙහිලා නාට්‍ය අධ්‍යාපනයේ ඇති වැදගත්කම

නාට්‍ය අධ්‍යාපනයේ ප්‍රධාන පරමාර්ථය නම් බුද්ධිමත් ස්වාධීන චින්තනයක් වර්ධනය කරගත් මනා පෞරුෂත්වයකින් හෙබි අනාගත පරපුරක් බිහි කරලීම ය. නාට්‍ය අධ්‍යාපනය මගින් පුද්ගලික සදාචාරාත්මක හා සමාජ තත්ත්වයන් හඳුනා-ගැනීමට හැකි වන බව ඒ. ජේ. බර්ටන්ට් නම් නාට්‍ය විචාරකයා ගේ අදහස ය. ළමා පෞරුෂ වර්ධනය හා යහපත් චරිතයක් ගොඩනැංවීම නාට්‍ය අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණක් විය යුතු බැව් නාට්‍ය අධ්‍යාපනය පිළිබඳ පර්යේෂකයකු හා විචාරකයකු වන ගබ්රියෙල් බර්න් පීල්ඩ් පවසා ඇත. නාට්‍ය අධ්‍යාපනයේ පරමාර්ථ හා අරමුණු පිළිබඳ දක්වන ලද පූර්වෝක්ත අදහස්වලින් පැහැදිලි වන කරුණක් නම් පුද්ගල සාරධර්ම වර්ධනය හා චරිත සංවර්ධනය සඳහා නාට්‍ය විෂය ඉතාමත් ප්‍රබල විභව්‍යතාවක් ඇති ඉගැනුම් කාරකයක් බව යි. නාට්‍ය විෂය සාරධර්ම අධ්‍යාපනයෙහිලා තෝතැන්නක් බැව් නාට්‍ය අධ්‍යාපනයේ පරමාර්ථ හා අරමුණු තුළින් ම විද්‍යමාන වේ.

පුද්ගලයකු තුළ යහපත් සිතුවිලි, සිරිත් විරිත්, හොඳ නරක, සමාජ හරයන් යනාදි සියලු ගුණාංග වඩාත් පහසුවෙන් රෝපණය කළ හැක්කේ එම පුද්ගලයා බුද්ධිමය චිත්තවේගීය හා මනා පෞරුෂය අතින් කිසියම් උසස් මට්ටමක පිහිටා සිටින විට ය. නාට්‍ය අධ්‍යාපනය තුළින් එම මූලික ගුණාංග ඉටු වන බැවින් සාරධර්ම අධ්‍යාපනයෙහිලා මෙම විෂයෙහි ඇති ශක්‍යතාව සෙසු විෂයන් අතර සුවිශේෂ වැදගත්කමක් ගනී. නාට්‍ය අධ්‍යාපනයේ අරමුණු හා ඒ තුළින් පුද්ගල සාරධර්ම වර්ධනය හා පෞරුෂය සංවර්ධනය වන ආකාරය මෙසේ දැක්විය හැකි ය.

## ළමා පෞරුෂය වර්ධනය හා යහපත් චරිත සංවර්ධනය

මෙය නාට්‍ය අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණකි. පුද්ගලයකු ගේ පෞරුෂ වර්ධනය කිරීම පවුල නැමැති ඒකකයෙන් ආරම්භ වෙයි. ඉන් අනතුරු ව පාසල සහ උසස් අධ්‍යාපන ආයතන වෙත එන ශිෂ්‍යයා ගේ චරිතය සංවර්ධනය කිරීම විෂය මාලාවේ සෑම විෂයක් තුළින් ම සිදු වෙයි. මෙහි දී නාට්‍ය විෂයෙන් කළ හැකි මෙහෙවර අන් සියලු විෂයන්ට වඩා වැදගත් වෙයි. නාට්‍ය අධ්‍යාපනයේ දී ළමයා තුළ රෝපණය වන සාමූහික බව, ඉවසීම, කාරුණික බව, එකමුතු කම, දයාව, අනුකම්පාව, වැඩිහිටියන්ට සැලකීම යනාදී සාරධර්ම මගින් පුද්ගල පෞරුෂය හා චරිතය සංවර්ධනය සිදු වේ. නාට්‍ය පෙළ කියවීමෙන් ජීවිත පරිකල්පනය තුළින් ද පෞරුෂය වර්ධනය වෙයි.

## සාමූහිකත්ව වර්ධනය

මෙය ද නාට්‍ය අධ්‍යාපනයේ එන සාරධර්ම වර්ධනය කෙරෙහි බලපාන වැදගත් අධ්‍යාපන අරමුණකි. නාට්‍ය සම්මිශ්‍රිත කලාවක් ලෙස නූතන නාට්‍ය විචාරකයකු වන "අයිෆර් එවන්ස්" පෙන්වා දී ඇත. එම ලක්ෂණය නිසා ම නාට්‍ය සමෝධානික විෂයක් ලෙස සැලකිය හැකි ය.

## ජීවන අත්දැකීම් පුළුල් කරගැනීම සහ සදාචාර වර්ධනය

එදිනෙදා ජීවිතයේ ප්‍රශ්නවලට විසඳුම් හා ජීවිත අත්දැකීම් ලබාගැනීමට නාට්‍ය විෂය ප්‍රයෝජනවත් වේ. එමෙන් ම සමාජයේ සිරිත් විරිත්, සාරධර්ම, යහපත් ආකල්ප වර්ධනය කර ගැනීමටත් චරිත සංවර්ධනයත් ඇති කරගැනීමට නාට්‍ය මගින් අත්දැකීම් ලැබේ. නාට්‍ය යනු සැබෑ ජීවිත අත්දැකීම් ප්‍රතිනිර්මාණය කිරීමකි. එය ජීවිතයේ කැඩපතක් වැනි ය. නාට්‍ය මගින් ඉදිරිපත් කරන අත්දැකීම් බොහෝ විට මනුෂ්‍ය ජීවිතයේ සනාතන අරගලය හා බැඳී පවතී. ඒ අනුව නාට්‍ය නැරඹීමෙන් හා රඟපෑමෙන් ජීවිත ගැටලුවලට විසඳුම් සොයා ගත හැකි ය. නව ජීවන අත්දැකීම් ලබා-ගැනීමට ද පෞද්ගලික අත්දැකීම් සාධාරණීකරණය කර ගැනීමට ද එමගින් අවකාශ ලැබේ.

## සදාචාරාත්මක හා සමාජ තත්ත්වයන් හඳුනා ගැනීම

ශිෂ්‍යයින් නාට්‍ය රඟපෑමෙන් ලබන පුහුණුව හා ශ්‍රේෂ්ඨ නාට්‍ය කෘති කියවා ලබන අත්දැකීම් තුළින් ජීවිතය පිළිබඳ පූර්ණ අවබෝධයක් ද සදාචාරාත්මක අවදි වීමක් ද ඇති වෙයි. නාට්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය හා සාමූහික සජීවී මාධ්‍යයක් වුව ද නාට්‍ය පෙළ කියවීමෙන් පමණක් වුව ද කිසියම් සාහිත්‍ය රසයක් අත්දැකීම් සම්භාරයක් ලබාගත හැකි ය. උසස් නාට්‍යකෘතිවල මෙම ලක්ෂණය විද්‍යමාන වෙයි. ශ්‍රේෂ්ඨ නාට්‍ය කෘති කියවීමෙන් පුද්ගලයින් තුළ විවිධ සිරිත් විරිත් සාරධර්ම, විවිධ ආගමික හා සංස්කෘතික අත්දැකීම් රාශියක් උකහාගත හැකි ය. ජීවිතය පිළිබඳ යථාවබෝධය, ජීවිත හරයන් හා උසස් චර්යාවන් ග්‍රහණය කරගන්නා සිසුන් තුළ ක්‍රම ක්‍රමයෙන් උසස් සදාචාරාත්මක අවදි බවක් වර්ධනය වන අතර පෞරුෂ සංවර්ධනය සිදුවේ.

## කලාත්මක හැඟීම් වර්ධනය

සාරධර්ම ඉගැන්වීමෙහි ලා මෙම අරමුණෙහි විශේෂ වටිනාකමක් ඇත. නාට්‍යයේ අන්තර්ගත සෞන්දර්යාත්මක පක්ෂය නිසා කලාත්මක හැඟීම් වර්ධනය සිදු වේ. නාට්‍ය රචනය, රඟපෑම, වෙස් මෝස්තර රචනය, චිත්‍ර කලාව, වේදිකා සැරසිලි, පසුබිම් අලංකරණය ආදී අංශ මගින් මෙම කලාත්මක අංශය වර්ධනය වීමට ඉඩ සැලසේ. පාසලේ දී මෙන් ම උසස් අධ්‍යාපන ආයතනවල දී මෙම කලාත්මක හැඟීම් වර්ධනය සඳහා ප්‍රායෝගික අත්දැකීම් ලබාදිය හැකි ය. නාට්‍ය විෂයට ඇතුළත් කොට නාට්‍ය නිෂ්පාදනයක් සඳහා සිසුන් යොදාගෙන සිසුන් කණ්ඩායම් කර ඒ ඒ කණ්ඩායම්වලට නාට්‍ය කොටස්වල වගකීම පැවරීම මගින් ඔවුන් තුළ කලාත්මක හැඟීම් හා සාරධර්ම වර්ධනය සිදුවන අතර ම අවංකකම, ඉවසීම, වගකීම් දැරීම වැනි ගුණාංග වර්ධනය වෙයි.

## සමාජ පුහුණුව හා පුද්ගලයා සමාජානුයෝගී කිරීම

සාරධර්ම වර්ධනයට වැදගත් වන නාට්‍ය අධ්‍යාපන අරමුණකි. සමාජයට උචිත හැසිරීම් පද්ධතියක් ගොඩනගා ගැනීමට නාට්‍ය අධ්‍යාපනය උපකාරි වෙයි. සමාජය පිළිබඳ යථාවබෝධය ලබාදීමෙන් සදාචාර වර්ධනයට ඉඩ කඩ ඇති වේ. මෙහිදී සෙසු විෂයයන් මගින් ඉටු කළ නොහැකි කාර්යභාරයක් නාට්‍ය විෂය මගින් ඉටු වේ. සමාජ පුහුණුව දේශන මගින් ලබා දිය නොහැකි ය. එය ඍජු අත්දැකීම් මගින් ලබා දිය යුතු ය.

## ආත්ම ප්‍රකාශනයට ඉඩ ප්‍රස්තා ලබා දීම

පුද්ගලයාට ආවේණික ආකාරයට තම අව්‍යාජ හැඟීම් ප්‍රකාශනය කිරීමට ඔහුගේ වර්ධනය හේතුවන බව වික්ටර් ලොවෙන්පෙල්ඩ් පෙන්වා දෙයි. හර්බට් රීඩ් පවසන අන්දමට ඇතුළතින් පැන නැගෙන ආවේගයන් පුද්ගලයාගේ ප්‍රකාශනයට හේතු වෙයි. එමගින් වින්දනයක් ලැබේ. එම ක්‍රියාකාරිත්වය මානසික සමබරතාවට අතිශයින් වැදගත් වෙයි. අවසානයේ එය සදාචාර වර්ධනයට හේතු වෙයි.

මේ නිසා පාසලේ හා අනෙකුත් අධ්‍යාපන ආයතන සියල්ලෙහි ම සාරධර්ම ඉගැන්වීමේ දී නාට්‍ය විෂයෙහි ඇති ආවේදනීය, වින්දනාත්මක හා ඍජු ක්‍රියාකාරී බව ප්‍රයෝජනයට ගත යුතු ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අතුකෝරල, ඩී. ආර්. (2001). සදාචාර සමාජයක් සඳහා චරිතායන අධ්‍යාපනය. රාජගිරිය: කේ. එස්. යූ. ග්‍රැපික්.

අබේපාල, ආර්. (1977). සෞන්දර්ය හා නාට්‍ය අධ්‍යාපන ප්‍රවේශය. කොළඹ: සමයවර්ධන.

අබේපාල, ආර්. (1992). සෞන්දර්ය හා නාට්‍යකරණය පිළිබඳ මනෝ විද්‍යාත්මක විග්‍රහයන්. කොට්ටාව: සාර ප්‍රකාශන.

අබේපාල, ආර්. (1994). නාට්‍යකරණය අධ්‍යාපන මාධ්‍යයකි. කොට්ටාව: සාර ප්‍රකාශන.

ඉලේපෙරුම, අයි. ඩී. කේ. (1995). සාරධර්ම අධ්‍යාපනයට හා එහි ගමන් මඟ. කොට්ටාව: ඇඩ්.ඇඩ්ස්.

කාරියවසම්, ටී. (1974). පියාජේගේ සංවර්ධන මනෝවිද්‍යාව. කොළඹ: ගුණසේන.

කාරියවසම්, සී. (1995). සාරධර්ම අධ්‍යාපනය. අධ්‍යාපනය සඟරාව, කොට්ටාව: සාර ප්‍රකාශන.

කාරියවසම්, සී. (1999). ලෝක අධ්‍යාපන ප්‍රවණතා. කොළඹ: ශික්ෂා මන්දිර ප්‍රකාශන.

කොතලාවල, එල්. සී (1977). පියාජේගේ මනෝ විද්‍යා න්‍යාය. කොළඹ: ලේක් හවුස්.

තරුණයින් පිළිබඳ ජනාධිපති කොමිසන් සභා වාර්තාව. (1990). කොළඹ: රජයේ මුද්‍රණාලය.

දිවිපැවැත්ම සඳහා ඉගෙනුම. (1998). කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. (සංස්.) (2003). මහා වංසය සිංහල. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සේනාධීර, එස්. (2005). ළමා වර්ධනය සහ සංවර්ධනය. කොළඹ: ගොඩගේ ප්‍රකාශන.

සොයිසා,ඒ. පී. ද. (1957). දීඝ නිකාය. කොළඹ: ධර්ම සමය.

සෝමරත්න, ඩබ්ලියු. ආර්. පී. (1954). අධ්‍යාපනික මනෝ විද්‍යාව. කොළඹ: ගුණසේන.

සෝමරත්න, ඩබ්ලියු. ආර්. පී. (1954). ළදරු අධ්‍යාපනය. කොළඹ: ගුණසේන.

සෝරත හිමි, අලුත්වැව. (1999). බෞද්ධ සමාජය සුරකින ආචාර සමාචාර විධි. දහම් අමා ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය. කොළඹ: රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

ශ්‍රී රාහුල හිමි, වල්පොල. (1993). ලක්දිව බුදු සමයේ ඉතිහාසය. කොළඹ: එම්. ඩී. ගුණසේන සමාගම.

වීරසිංහ, එච්. (1977). අධ්‍යාපන දර්ශන ප්‍රවේශය. කොළඹ: ලේක්හවුස්.

Bloom, B.S. (1956). Texonomy of Educational Objectives. Hand Book 1,Cognitive Domain. Newyork: Davis Mckay Co.

Bloom, B.S., Krathwoli, D.R., & Masia, B.B. (1964). Texonomy of Educational Objectives. Hand Book п, Affective Domain. Newyork: Davis Mckay Co.

Gupta, N.L. (2000). *Human Values in Education*. New Delhi: Concept Publishing Company.

Gustave J. W.M. (2008). Process Drama in Education General Considerations. [Online]. Janaury 2011.Available from: http://interactiveimprov.com/procdrmwb.html. [Accessed: 2nd March 2011]

Matt, B. (n.d.) Why Teach Drama? A Defense of the Craft. [Online]. Janaury 2011. Available from: http://www.Chiddrama.com/ why.html. [Accessed: 2nd March 2011]

Mersand, J. (1969). Teaching the Drama in Secondary Schools. Metuchen: N.J.The Scarecrow Press, Inc

Peachment, B. (1976). *Educational Drama.*London: Macdonald & Evans Ltd.

The Value of education. (n.d.) The Value of education. [Online]. Janaury 2011. Available from: http:// www.school-info4u.com/. [Accessed: 2nd March 2011]

Venkataiah, N. (1998). Value Education. Delhi: Efficient offset printers.